PRESS RELEASE

PR23/326

# ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි කාර්යමණ්ඩලයේ ශ්‍රී ලංකා සංචාරය නිමා කරයි

වහාම නිකුත් කිරීම සඳහා

රටක් වෙත කළ සංචාරයෙන් පසු සිදු කළ මූලික සොයා ගැනීම් පිළිබිඹු කරන ජා.මූ.අ. කාර්යමණ්ඩල කණ්ඩායමේ ප්‍රකාශයන්ට එම දූත මෙහෙවර අවසානයේ දී නිකුත් කරනු ලබන මාධ්‍ය නිවේදන ඇතුළත් වේ. මෙම ප්‍රකාශයෙහි නිකුත් කරන ලද අදහස් ජා.මූ.අ. කාර්යමණ්ඩලයෙහි අදහස් වන අතර, ජා.මූ.අ. විධායක මණ්ඩලයෙහි අදහස් අවශ්‍යයෙන් ම නියෝජනය කෙරෙයි.

- *ජා.මූ.අ. කණ්ඩායම විසින් ජා.මූ.අ. විස්තීර්ණ අරමුදල් පහසුකම යටතේ සිදු කළ ප්‍රථම සමාලෝචනය තහවුරු කරමින් ආර්ථික කාර්යසාධනය සහ ප්‍රතිපත්ති පිළිබඳව ශ්‍රී ලාංකික බලධාරීන් සමඟ ඵලදායී සහ සාරවත් සාකච්ඡාවන් පවත්වන ලදී.*
- *ශ්‍රී ලාංකික ප්‍රජාව සුවිශේෂී ලෙස ඔරොත්තු දීමේ හැකියාව පිළිබිඹු කර ඇති අතර, වැදගත් ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් බලධාරීන් සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත. ශ්‍රී ලංකාවට එහි උග්‍ර ආර්ථික අර්බුදයෙන් නැඟී සිටීමට ඉඩ සැලසීම සඳහා අවශ්‍ය වන ප්‍රතිසංස්කරණ වේග ශක්තිය පවත්වා ගෙන යනු ඇති, නුදුරු කාලීන තුළ කාර්යමණ්ඩල එකඟතාවක් කරා මෙම සාකච්ඡාවන් අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.*
- *ජා.මූ.අ. සහාය ලත් මෙම වැඩසටහනෙහි අරමුණු මගින් දිළිඳු සහ අවදානමට ලක් විය හැකි පාර්ශ්වයන් රැක ගැනීම, මූල්‍ය ස්ථායීතාව ආරක්ෂා කිරීම, දූෂණ සාන්තරායත්වයන්ට පිළියම් යෙදීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීම සහ ශ්‍රී ලංකාවේ අනාගත වර්ධන හැකියාව විවර කිරීම සිදු කෙරෙන අතරතුර, සාර්ව ආර්ථික ස්ථායීතාව සහ ණය තිරසරභාවය අඛණ්ඩව ඉලක්කගත කෙරෙනු ඇත.*

**කොළඹ, ශ්‍රී ලංකාව - 2023, සැප්තැම්බර් 27** : පීටර් බෘවර් මහතා සහ කත්සියර්නා ස්විරිඩ්සෙන්කා මහත්මිය ප්‍රධාන කොටගත් ජා.මූ.අ. දූත කණ්ඩායම විස්තීර්ණ අරමුදල් පහසුකම යටතේ වූ වැඩසටහනෙහි ප්‍රථම සමාලෝචනයෙහි අනුමැතිය සඳහා ආර්ථික සහ මූල්‍ය ප්‍රතිපත්ති සාකච්ඡා කිරීමට 2023, සැප්තැම්බර් 14 සිට 27 දක්වා කොළඹ සංචාරයක යෙදුණහ.

මෙම දූත මෙහෙයුම අවසානයේ දී පීටර් බෲවර් මහතා සහ කත්සියර්නා ස්විරිඩ්සෙන්කා මහත්මිය විසින් පහත ප්‍රකාශය නිකුත් කරන ලදී:

"ශ්‍රී ලාංකික ප්‍රජාව සුවිශාල අභියෝග හමුවේ සුවිශේෂී ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කර ඇත. අසීරු වුව ද බෙහෙවින් අවැසි වූ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාව ප්‍රශංසනීය ප්‍රගතියක් අත්කර ගෙන ඇත. ආර්ථිකය ස්ථාවරත්වයට පත්වීමේ තාවකාලික සලකුණු පෙන්නුම් කිරීමත් සමඟ, මෙම ප්‍රයත්නයන් ඵල දරමින් සිටියි. උද්ධමනය 2022 වසරේ පැවති ඉහළම අගයක් වූ සියයට 70 සිට 2023 සැප්තැම්බර් මාසයේ දී සියයට 2ක් දක්වා පහළ ගොස් ඇති අතර, දළ නිල සංචිත මෙම වසරේ මාර්තු - ජුනි කාලපරිච්ඡේදයේ දී එ.ජ. ඩොලර් බිලියන 1.5කින් ඉහළ ගොස් ඇති ඇත. එමෙන්ම, අත්‍යවශ්‍ය භාණ්ඩවල හිඟය ද ලිහිල් වී ඇත. ආර්ථිකය ස්ථාවරත්යට පත්වීමේ පෙරමං සලකුණු පැවතිය ද, ආර්ථික පූර්ණ වශයෙන් යථා තත්ත්වයට පත්වීම තවමත් සහතික කර නොමැත. වර්ධන වේගය මැඩ පැවත්වී තිබෙන අතර, 2 වන කාර්තුවේ මූර්ත ද.දේ.නි. වාර්ෂික ලක්ෂ්‍යමය පදනමක් මත සියයට 3.1 පහළ යෑමත්, ඉහළ සංඛ්‍යාතයකින් යුත් ආර්ථික දර්ශක අඛණ්ඩව මිශ්‍ර සංඥා සැපයීමත් දක්නට ලැබේ. සංචිත එක්රැස් වීමෙහි මෑතක මාසවලදී පහළ යෑමක් පෙන්නුම් කෙරිණි.

"දිගුකල් පවත්නා ප්‍රතිසාධනයක් සහ ස්ථාවර හා සාර්ව සහභාගීත්වයක් සහිත වර්ධනයක් කරා දිවෙන මාර්ගය වෙත ආර්ථිකය යොමු කිරීම සඳහා ප්‍රතිසංස්කරණ වේගය නොනවත්වා පවත්වා ගෙන යෑම ඉතා වැදගත් වේ. බලධාරීන් විසින් මෙම වැඩසටහනෙහි මූලික තුලන ඉලක්ක සාක්ෂාත් කර ගෙන ඇති අතර, ණය තිරසරබව ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ඔවුන් ගෙන ඇති ප්‍රයත්නයන්ට සහාය ලබා දීමට හැකි වන පරිදි, මෙම වැඩසටහනෙහි ඉතාමත් වැදගත් ම අංශය වෙත කැපවී ක්‍රියා කරයි. කෙසේ වෙතත්, පසුගිය වසරට සාපේක්ෂ ව අර්ධ වශයෙන් ආර්ථික සාධක හේතුවෙන් ඉහළ ගිය ආදායම් සංචලන ලාභ වසර අවසානයේ දී මූලික පුරෝකථනවලට වඩා ආසන්න වශයෙන් සියයට 15කින් පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම හිඟය පිරිමසා ගැනීම කිසිදු ප්‍රයත්නයක් නොයෙදුවේ නම්, රාජ්‍ය මූල්‍ය ගැළපුමෙහි භාරදූර වගකීම රාජ්‍ය වියදම මත පැටවෙනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස අත්‍යවශ්‍ය පොදු සේවාවන් සැපයීමට රජයට තිබෙන හැකියාව දුර්වල කෙරෙනු ඇති අතර, ඉන් ණය තිරසරබව කරා තිබෙන මාර්ගයට බාධා එල්ල වනු ඇත. ආදායම් ඉහළ නැංවීමට සහ මනා පාලනයක් ඇති කිරීමට, බදු පරිපාලනය ශක්තිමත් කිරීම, බදු නිදහස් කිරීම් ඉවත් කිරීම සහ සක්‍රීය බදු පැහැර හැරීම් තුරන් කිරීම වැදගත් වේ.

"අඛණ්ඩ අවිනිශ්චිතතාවට එරෙහි ව, ශක්තිමත් සංචිත එක්රැස් කිරීමක් ඔස්සේ බාහිර ස්වාරක්ෂක යළි ගොඩනැඟීම ද වැදගත් කරුණකි. උද්ධමනය

පාලනය කිරීමෙහිලා ශ්‍රී ලංකා මහ බැංකුවේ සාර්ථකත්වය මත ගොඩනැඟීම, මුදල් මූල්‍යනයෙන් වැළකී සිටීම මගින් උද්ධමනය පරීක්ෂාකාරීව තබා ගැනීමට උපකාරී වනු ඇත. විදුලි බලය මිලයනයෙහි පිරිවැය ප්‍රතිසාධනය පවත්වා ගෙන යෑම වෙනත් අභියෝගයන්ට අයත් වේ.

"ශ්‍රී ලංකා රජය ව්‍යුහාත්මක සංස්කරණ සම්බන්ධව අඛණ්ඩ ප්‍රගතියක් අත්කර ගෙන ඇත. නව මහ බැංකු පනත සහ දූෂණ විරෝධී පනත ඇතුළු ව, පාර්ලිමේන්තුවේ දී සම්මත වූ ප්‍රධාන නීති සම්පාදන සාර්ථක ව ක්‍රියාත්මක කළහොත්, පාලනය වැඩිදියුණු කරගත හැකිය. ජා.මූ.අ. පාලන විනිශ්චය වාර්තාව ප්‍රකාශය කළ විට පාලනය ශක්තිමත් කිරීම සඳහා වන අනාගත ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග දැනුම් දෙනු ඇත. ඉලක්කගතකරණය, ප්‍රමාණවත් බව සහ සමාජ ආරක්ෂණ දැල්වල ආවරණය ඉහළ නැංවීම අරමුණු කරගත් නව යෝග්‍යතා නිර්ණායකයත් සමඟ නව සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කෙරිණි. මූල්‍ය ස්ථායීතාව සහතික කිරීම සඳහා, බැංකු විනිශ්චයන් පැවැත්වීම, බැංකුකරණ පද්ධති ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතා හිඟයට පිළියම් යෙදීම සඳහා පෙරදැක්මක් සංවර්ධනය කිරීම සහ බැංකුවල නිරාකරණ රාමුව වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනුණි.

දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය ක්‍රියාත්මක කිරීම සහ විදේශීය ණය හිමියන් සමඟ අඛණ්ඩ ව සාකච්ඡා සිදු කිරීම ඔස්සේ ණය තිරසරබව යළි අත්කර ගැනීම සම්බන්ධයෙන් බලධාරීන් ද ඉදිරියට ක්‍රියා කර ඇත. ශ්‍රී ලංකාව ගෙවිය යුතුව පවතින රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කරමින් සිටින බැවින්, මූල්‍යයන සහතික කිරීමේ සමාලෝචන සම්පූර්ණ කිරීම, පළමු වැඩසටහන් සමාලෝචනයෙහි විධායක මණ්ඩල අනුමැතිය සඳහා අවශ්‍ය වේ. මෙම වැඩසටහනෙහි ණය ඉලක්ක හා අනුකූල ව, කාලීන ආකාරයකින් අවසන් කෙරෙනු ඇති විශ්වාසය ලබා දීම සඳහා ණය ප්‍රතිව්‍යුහගතකරණය සමඟ ප්‍රමාණවත් ප්‍රගතියක් අත්කර ගෙන ඇති දැයි මෙම මූල්‍යයන සහතික කිරීමේ සමාලෝචන මගින් ඉලක්කගත කෙරෙනු ඇත.

"සාකච්ඡා සිදු කෙරෙමින් පවතින අතර, බලධාරීන් ආදායම් සංචලන ඉලක්ක, දූෂණ විරෝධී ප්‍රයත්න සහ අනෙකුත් වැදගත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සඳහා වන ඔවුන්ගේ සැලසුම් සම්බන්ධයෙන් අඛණ්ඩ ව ප්‍රගතියක් අත්කර ගනිමින් සිටියි.

"ජා.මූ.අ. කණ්ඩායම විසින් ජනාධිපති සහ මුදල් අමාත්‍ය රනිල් වික්‍රමසිංහ, ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ, රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ, ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක, භාණ්ඩාගාර ලේකම් කේ එම් මහින්ද සිරිවර්ධන සහ අනෙකුත් රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ මහ බැංකු නිලධාරීන් සමඟ රැස්වීම් පවත්වන ලදී. ජා.මූ.අ. කණ්ඩායම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පෞද්ගලික අංශයේ

නියෝජිතයින්, සිවිල් සමාජ සංවිධාන සහ සංවර්ධන හවුල්කරුවන් ද හමු විය.

“දූත මෙහෙවර අතරතුර දී දැක්වූ විශිෂ්ට සහයෝගීතාව වෙනුවෙන් බලධාරීන්ට ස්තූති කිරීමට අපි කැමැත්තෙමු. නුදුරු කාලීන ව කාර්යමණ්ඩල මට්ටමේ ගිවිසුමකට එළඹීමේ අරමුණින් මෙම කණ්ඩායම පළමු සමාලෝචන පසුබිම තුළ සිය සාකච්ඡා අඛණ්ඩ ව සිදු කරනු ඇත. මෙම දුෂ්කර අවස්ථාවේ දී ශ්‍රී ලංකාවට සහය දැක්වීමට අප කැපවීමෙන් ක්‍රියා කරන බවට යළිත් තහවුරු කරන්නෙමු.”